ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.

VII සභා වාරය හතළිස් නමවන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.
දිනය : 2022.03.16.
වේලාව: පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:

01. ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
14 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය.
17.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
05. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.

නිලධාරි සහභාගීත්වය:

01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.
03. සංවර්ධන නිලධාරි - ශකිලා දිනිති මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ හතළිස් නමවන සභාව සඳහා පැමිණි ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, මාධ්‍යවේදී මහත්ම මහත්මීන් සහ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීනුත් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.
ගරු සභාපතිතුමා විසින් 2022.02.08. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් 2022.02.08. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.02.08. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන රහිතව ඒකමතිකව සභා සම්මත විය.

(02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.
ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
(i). සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මැතිතුමා 2022.03.15. වන දින බලංගොඩ ප්‍රදේශයේ නිරීක්ෂණ කටයුතු සඳහා සහභාගී වුණා. මා ඇතුළු මන්ත්‍රීවරුන් කණ්ඩායමක් එම අවස්ථාවට සහභාගී වුණා. මාසික මහ සභා රැස්වීම 2022.03.15. වන දින පැවැත්වීමට දින නියම කර තිබුණත් එම අවස්ථාවට සහභාගී වීම හේතුවෙන් 2022.03.16 වන අද දින දක්වා රැස්වීම කල් දැමීමට සිදු වූ බව දන්වා සිටිනවා.

(ii). රාජ්‍ය ආයතන අතර සුහදතාවය වර්ධනය කිරීම සඳහා බලංගොඩ ප්‍රාදේශීය සභාව විසින් තෙවන වරටත් සංවිධානය කරනු ලබන " සැහැල්ලු පන්දුවෙන් එකම තණතිල්ලක උරින් උර ගැටෙන 2022 රාජ්‍ය සේවා සුහද ක්‍රිකට් තරඟාවලිය" 2022 මාර්තු මස 20 වන දින බලංගොඩ නගර සභා මහජන ක්‍රීඩාංගනයේ දී පැවැත්වේ. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ටද ඒ සඳහා සහභාගී වීමට අවස්ථාව පවතින බැවින් ඒ සඳහා සහභාගී වන්න.

(iii). රටතුල විදුලි අර්බුදයක් නිර්මාණය වි ඇති බැවින් මෙම අභියෝගාත්මක තත්ත්වය කළමනාකරණය කිරීම උදෙසා විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කරන ලෙසත්, ජන ජීවිතයට අවම බලපෑම් වන ලෙස බල ප්‍රදේශය තුල සවි කරන ලද වීථි පහන් 2022.03.31. දින දක්වා නිවා දැමීමට කටයුතු කරන ලෙසත් මුදල් අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමා විසින් ඉල්ලීම් කර තිබෙනවා. ඒ අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වනඅලින් ගැවසෙන ප්‍රදේශයන් හැර අනෙකුත් ප්‍රදේශවල පමණක් 2022.03.31. දින දක්වා විථි පහන් අක්‍රීය කිරීමට කටයුතු කරන ලෙසත් ඒ පිළිබඳව ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමටත් කටයුතු කරන්න.

(03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.
(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් නන්පේරියල් මංසන්ධිය අසල පිහිටි අක්කර පහකින් පමණ සමන්විත රජයට අයත් ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට අදාලව ප්‍රදේශයේ නගර සංවර්ධනය සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,

මෙම ඉඩම් කොටස සබරගමුව විශ්ව විද්‍යාලයේ සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන ලෙසට ඉල්ලීම් කර තිබෙනවා. එහෙත් සබරගමුව විශ්ව විද්‍යාලයට ප්‍රදේශය තුලින් අවශ්‍ය තරම් ඉඩම් පවරාගෙන තිබෙනවා. එම නිසා මෙම ඉඩම් කොටස ප්‍රදේශයේ නගර සංවර්ධනය සඳහා යොදා ගැනීමට ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන්න.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ප්‍රදේශයේ නගර සංවර්ධනය සඳහා නන්පේරියල් මංසන්ධිය අසල පවතින අක්කර පහක පමණ ඉඩම් කොටස ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලෙසට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත දන්වා යවනවා.

(ii). නිල්වලා ප්‍රජා මූල සංවිධානයේ වසර විසි පහකට ප්‍රථම කරපේ, නවගම්මානය, ගිල්මේ, බදුල්ල පාරෙන් උඩ කොටස හා යට කොටස යන ප්‍රදේශවල නිවෙස් සඳහා රජයට අයත් ඉඩම් ඔස්සේ ජලනල මාර්ගය එළලා ජලය ලබා ගන්නා ලද අතර, එම ඉඩම්වල පදිංචිකරුවන් පදිංචි වීම හේතුවෙන් එම ඉඩම් කොටස් වෙනත් පුද්ගලයන්ට විකිණීම හා එම ඉඩම් සංවර්ධන කටයුතු හේතුවෙන් ජලනල මාර්ගය පෞද්ගලික ඉඩම්වල එළලා ඇති බවත්, බදුල්ල කොළඹ මාර්ගයේ 153 – 155 අතර කිලෝමීටර් කණු අතර මාර්ගයේ මෙම ගැටලුව පවතින බවත්, දන්වමින් එම නිසා මෙම ජලනල මාර්ගය බදුල්ල කොළඹ මාර්ගය අසලින් එළලා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ඉඹුල්පේ නිල්වලා ප්‍රජා ජල මූල සංවිධානයේ ලේකම් විසින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා මඟින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින්,
බදුල්ල කොළඹ මාර්ගය අසලින් ජල නල එළලා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සලසා දෙන්න.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
බදුල්ල කොළඹ මාර්ගය අසලින් ජල නල එළලා ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙසට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත දන්වා යවනවා..

(04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.
(i). කොරෝනා වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එන්නත් ලබාගෙන ඇති පිරිස පිළිබඳ තොරතුරු වාර්තා කරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා යෝජනා කලා. ඒ අනුව මා විසින් ඉඹුල්පේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා දැනුවත් කර අදාල තොරතුරු ලබා ගැනීමට පියවර ගත්තා. ඒ අනුව ඉඹුල්පේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් ඒ පිළිබඳව අදහස් දක්වමින්,
බල ප්‍රදේශය තුල ජනතාවගෙන් AstraZeneca පළමු මාත්‍රාව - 720 ක් ද දෙවන මාත්‍රාව 704 ක් ද ලබාගෙන ඇති අතර ඒ අනුව AstraZeneca එන්නත් මාත්‍රා 1424 දෙනෙක් ලබාගෙන තිබෙනවා.
Sinopharm පළමු මාත්‍රාව 44260ක් ද, දෙවන මාත්‍රාව 47044 ක් ද ලබාගෙන ඇති අතර මත්‍රා දෙකම - 91304 ක් ද ලබා ගෙන තිබෙනවා.
Pfizer
විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගෙන් පළමු මාත්‍රාව 396 ක් ලබාගෙන ඇති අතර, දෙවන මාත්‍රාව කිසිවෙක් ලබාගෙන නැහැ.
පාසල් දරුවන්ගෙන් වයස අවුරුදු 12 – 15 ත් අතර දරුවන් 2585 ක් ද, වයස අවුරුදු 16 – 19 ත් අතර දරුවන් 2445 ක් ද, එහි තෙවන මාත්‍රාව වයස අවුරුදු 60 ට වැඩි - 7818 ක් ද, වයස අවුරුදු 30 – 59 ත් අතර 16220 ක් ද, වයස අවුරුදු 20 – 29 ත් අතර 2532 ක්ද එහි එකතුව 32380 ක් වශයෙන් එන්නත්කරවාගෙන තිබෙනවා.

ඒ අනුව වසංගත තත්ත්වය මර්ධනය කිරීම සඳහා මුදල් හිඟ කාලය තුල දී වුවත්, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එන්නත්කරණය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් වසංගත තත්ත්වය පාලනය කිරීමට කටයුතු කළා. බල ප්‍රදේශය තුල එන්නත්කරන වැඩසටහන් වලදී මන්ත්‍රීවරුන් තම මුදල් පවා වියදම් කරමින් සහයෝගය දැක්වූවා. ඒ සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ට ස්තුතිය පල කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඉතාමත් කඩිනමින් එන්නත්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක වුණා. ඒ සම්බන්ධයෙන් ඉඹුල්පේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා ඇතුළු සියලුම නිලධාරීන්ටත්, ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරීන්ටත් ස්තුතිය පල කර ලිපි යොමු කරනවා.

(05). යථා පරිදි කල් දී ඇති යෝජනා.

(i). ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති ඇල්ලේඅරාව මැලිබන් ඇඟලුම් කම්හල ඉදිරිපිට පිහිටා ඇති ඉඩම ප්‍රදේශයේ පුද්ගලයන් විසින් අනවසරෙන් භුක්ති විදින බැවින්, 1979 අංක 7 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත සහ 1981 අංක 58 දරණ සහ 1983 අංක 29 දරණ සංශෝධනය කරන ලද පනත් ප්‍රකාරව සන්තකය ආපසු ලබා ගැනීමට අදාලව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින්, සමනල වැව සංවර්ධන ජල ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රදේශය තුල පදිංචිව සිට ඉඩම් අහිමි වූ ජනතාවට වෙනත් ස්ථානවලින් ඉඩම් ලබා දීමට පියවර ගත් අවස්ථාවේ දී පොදු කටයුතු සහ වෙළඳකුටි ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභාවට ඉඩම් කොටසක් ලබා දී තිබුණා. වර්තමානය වන විට සභාවට අයත් එම ඉඩම කොටස ප්‍රාදේශීය සභාවේ පාලනයකින් තොරව ප්‍රදේශයේ පුද්ගලයන් විසින් පෞද්ගලිකව පරිහරණය කරනවා. ඔවුන්ට අසාධාරණයක් නොවන ආකාරයටත් සභාවට ආදායමක් ලැබෙන ආකාරයටත් මූලික කටයුතු සිදු කොට සභාවට අයත් ඉඩමේ සන්තකය ආපසු පවරා ගැනිමට කටයුතු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

පොදු සුසාන භූමිය අසල සිට බෝධිය අසල දක්වා ඉඩම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තරුණ සේවා සභා ගොඩනැගිල්ල පිහිටි හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටි භූමිය, සමෘද්ධි බැංකුව අසල පිහිටි භූමිය වශයෙන් එම ස්ථානයේ ඉඩම් කොටස් 03 ක් තිබෙනවා. එම ඉඩම් කොටස් ප්‍රාදේශීය සභාවට ආදායමක් උපයාගත හැකි ආකාරයටත්, අනවසර පදිංචිකරුවන්ට සහනයක් සැලසෙන ආකාරයටත් පවරා ගැනිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව විසින් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති ඇල්ලේඅරාව මැලිබන් ඇඟලුම් කම්හල ඉදිරිපිට පිහිටා ඇති ඉඩම 1979 අංක 7 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත සහ 1981 අංක 58 දරන සහ 1983 අංක 29 දරන සංශෝධනය කරන ලද පනත් ප්‍රකාරව නීත්‍යානුකුල ආකාරයට සන්තකය ආපසු ලබා ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). ලොව පුරා ප්‍රකට වී ඇති බෙලිහුල්ඔය සංචාරක පහන්තුඩාව ඇල්ල නැරඹීම සඳහා සභාව විසින් දේශීය සහ විදේශීය සංචාරකයන් සඳහා දැනට අය කරනු ලබන රු. 20.00 ක ප්‍රවේශ පත්‍ර ගාස්තුව, දේශීය සංචාරකයන් සඳහා රු. 30.00 ක් දක්වා වැඩි කිරීමටත්, විදේශිය සංචාරකයන් සඳහා රු. 200.00 ක් දක්වා වැඩි කිරිමටත් අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින්, සංචාරකයන් සඳහා පහසුකම් සහිතව දේශීය සහ විදේශීය සංචාරකයන් සඳහා වෙන වෙනම භාවිතා කල හැකි පරිදි වැසිකිළි පද්ධතියක් ඉදිකර ඇති බවත් සභාවේ කම්කරු මහත්මයෙක් එම ස්ථානයේ සේවය සඳහා යොදවා කසළ කළමනාකරණ කටයුතු විධිමත් පරිදි පවත්වාගනිමින් එම ස්ථානය යාවත්කාලීනව පවත්වාගෙන යාමට ක්‍රියාකර ඇති බව ප්‍රකාශ කරන ලදි.

ඉදිරිපත් කර ඇති ආකාරයට ගාස්තු සංශෝධනය කිරීම සුදුසු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව බෙලිහුල්ඔය සංචාරක පහන්තුඩාව ඇල්ල නැරඹීමේ ප්‍රවේශ පත්‍ර ගාස්තුව වශයෙන් දැනට දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා අය කරනු ලබන රු. 20.00 ක ගාස්තුව දේශීය සංචාරකයන් සඳහා රු. 30.00 ක් ලෙසත්, විදේශිය සංචාරකයන් සඳහා රු.200.00 ලෙසත් මිල සංශෝධනය කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(iii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි 102/2 මහ එළිය පාර දකුණ, ඊ.එම්. චන්ද්‍ර රත්න මයාගේ තහඩු සෙවිලි කල වී මෝල 2018 වර්ෂයේ සිට කඩා ඉවත් කර ඇති බවත්, ඒ බව තහවුරු කිරීමට වසමේ ග්‍රාම නිලධාරි මහතා විසින් අදාල ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති බවත්, ප්‍රාදේශීය සභාවේ ආදායම් නිලධාරිනිය විසින් ද ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කරමින්, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව,
2018 00.24
2019 549.00
2020 549.00
2021 549.00
2022 549.00 බැගින් 2,196.00 ක මුදලක් අදාල වර්ෂ සඳහා වරිපනම් ගාස්තු ලේඛන වලින් කපා හැරීමටත්, ඉදිරියට බිල් කිරීම නතර කිරීමටත් අදාලව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

එම ස්ථානයේ පැවැති වී මෝල කඩා ඉවත් කර දමා ඇති බැවින් ගණනය කරන ලද මුදල කපා හැරීමත්, නැවත අය කිරීම නතර කිරීමත් සුදුසු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව, මහ එළිය පාර දකුණ, ඊ.එම්. චන්ද්‍ර රත්න මහතාගේ තහඩු සෙවිලි කල වී මෝල 2018 වර්ෂයේ සිට කඩා ඉවත් කර ඇති බැවින් ගණනය කරන ලද මුදල කපා හැරීමේ නැවත අය කිරීම නතර කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.
(iv). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2021 වර්ෂයේ අයවැය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන් සහ ගරු මන්ත්‍රීවරියන් විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා කොරෝනා වසංගත තත්ත්වය නිසාත්, ද්‍රව්‍ය හිඟතාවය නිසාත් 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බැවින් 2022 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන යටතේ වෙන්කරනු ලබන ප්‍රතිපාදන ඔස්සේ එම සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාලව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

2021 වර්ෂයේ අයවැය මඟින් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ සංවර්ධන යෝජනා 2022 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021 වර්ෂයේ අයවැය මඟින් ක්‍රියාත්මක කිරිමට නොහැකි වූ සංවර්ධන යෝජනා 2022 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(v). ඉඹුල්පේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ළමා සෙල්ලම් මිදුල හා අවට ප්‍රදේශය සංවර්ධනය කිරිම සඳහා ඉන්ටලොග් ගල් කැට 360 ක් ලබා දෙන ලෙසට ඉල්ලමින් ඉඹුල්පේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් එම ආයතනයේ සෙල්ලම් මිදුල සංවර්ධනය කිරිම සඳහා ඉන්ටලොග් ගල් කැට 360 ක් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ඉඹුල්පේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට ඉන්ටලොග් ගල් කැට 360 ක් ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ඉඹුල්පේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට ඉන්ටලොග් ගල් කැට 360 ක් ලබා දීමේ අදාල යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(vi). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන අලුත්නුවර, ගලගම, පින්නවල, ජල ව්‍යාපෘති වැඩි දියුණු කිරිම මඟින් සභාවට ආදායම් මාර්ග වැඩි දියුණු කරවා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවේ ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් කාර්මික නිලධාරි මහතා විසින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුව අනුව දේශීය සහ ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගැනීමට අදාල යෝජනාව ඉදිරිපත් කරමින් ණය මුදලක් ලබා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.
කාර්මික නිලධාරි මහතා විසින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුව අනුව දේශීය සහ ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා විසින් එම යෝජනාව කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී,ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.
නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
1976 වර්ෂයේ දී පමණ දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබාගෙන පින්නවල ජල යෝජනා ක්‍රමය සංවර්ධනය කලා.

ඒ අනුව අලුත්නුවර, ගලගම, පින්නවල, ජල ව්‍යාපෘති වැඩි දියුණු කිරිම මඟින් සභාවට ආදායම් මාර්ග වැඩි දියුණු කරවා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවේ ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් කාර්මික නිලධාරි මහතා විසින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුව අනුව දේශීය සහ ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(vii). ඓතිහාසික කුරගල පුදබිමේ මෙවර රාජ්‍ය වෙසක් උත්සවය සංවිධානය කරමින් පවතින බැවින්, බලංගොඩ ප්‍රදේශයේ එම උත්සවය පැවැත්වීම පිළිබඳ මහත් අභිමානයට සහ ආඩම්බරයට පත් වන බව ප්‍රකාශ කරමින්, උත්සව සංවිධාන කටයුතු සඳහා කොඩි මඟින් එම ප්‍රදේශය සැරසිලි කරමින් අනුග්‍රහය දක්වන ලෙසට එම විහාරස්ථානයේ නෙල්ලිගල ස්වාමීන් වහන්සේගේ වාචික ඉල්ලිම පරිදි, සභා අරමුදලින් යම් දායකත්වයක් ලබා දීමට අදාලව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත

කරමින්, සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව එම සැරසිලි කටයුතු සඳහා රු. 100000.00 ක මුදලක් ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
සෑම වර්ෂයකම කොළඹ වැනි නගරබද ප්‍රදේශවල රාජ්‍ය වෙසක් උත්සවය සංවිධානය කරනවා. එහෙත් මෙවර මේ ප්‍රදේශය තෝරා ගැනීම විශාල සතුටක්. ඒ පිළිබඳව නිහතමානීව ආඩම්බර වෙනවා.

ඒ අනුව ඓතිහාසික කුරගල පුදබිමේ මෙවර පැවැත්වෙන රාජ්‍ය වෙසක් උත්සවය සංවිධානය කිරිමේ දී කොඩි මඟින් එම ප්‍රදේශය සැරසිලි කිරීමේ කාර්යය සඳහා සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සභා අරමුදලින් රු. 100000.00 ක මුදලක් වෙන් කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(viii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල අවිධිමත් ආකාරයට පෝස්ටර් සහ බැනර් ප්‍රදර්ශනය කිරිමත් එය පරිසර අලංකරණයට බාධාවක් වන බැවින් ප්‍රසිද්ධ ස්ථාන තෝරාගෙන සභා අරමුදල් යොදා ස්ථිර දැන්වීම් පුවරු සකස් කිරිමටත්, බදු දිම සඳහා 8x4 ප්‍රමාණයේ කොටසක් වෙන් කර ඇති අතර ඒ සඳහා මාසිකව අවම ලංසු මුදල රු. 1250.00 ක් ලෙස අය කිරිමට හැකි වන පරිදි එම දැන්වීම් පුවරු බදු දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි. සභා අරමුදලින් දැන්විම් පුවරු සකස් කර එම දැන්විම් පුවරු ඉල්ලුම්කරුවන් සඳහා බදු දිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී,ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රසිද්ධ ස්ථාන තෝරාගෙන සභා අරමුදල් යොදා ස්ථිර දැන්වීම් පුවරු සකස් කිරිමටත්, බදු දිම සඳහා 8x4 ප්‍රමාණයේ කොටසක් වෙන් කර ඇති අතර ඒ සඳහා මාසිකව අවම ලංසු මුදල රු. 1250.00 ක් අය කිරිමට හැකි වන පරිදි එම දැන්වීම් පුවරු බදු දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ix). ඉවතලන කසළ විධිමත් පරිදි බැහැර කිරීම සඳහා හියුම් පයිප්පයක් ලබා දෙන ලෙසට බී - මාරතැන්න ප්‍රාදේශීය රෝහලේ ආයතන භාර වෛද්‍ය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව විධිමත් පරිදි කසල බැහැර කිරීම සඳහා එම රෝහලට හියුම් පයිප්පයක් ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ඉවතලන කසළ විධිමත් පරිදි බැහැර කිරීම සඳහා සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව බී - මාරතැන්න ප්‍රාදේශීය රෝහලට හියුම් පයිප්පයක් ලබා දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(x). ප්‍රදේශවාසීන්ට අවශ්‍ය තොරතුරු කඩිනමින් ලබා ගැනීම, ප්‍රාදේශීය සභාවෙන් ලබා ගත හැකි සේවාවන් පිළිබඳව කඩිනමින් දැනගැනීම සහ එම සේවා ඉටු කරවා ගැනීමට අදාල තොරතුරු දැන ගැනීම සඳහා සභා කාර්යාලයේ නිල වෙබ් අඩවිය වසර 07 කින් පමණ යාවත්කාලීනව පවත්වා ගැනීමකින් සිදු කර නොමැති බැවින්, නිල වෙබ් අඩවිය නැවත සම්පූර්ණයෙන් සංවර්ධනය කල යුතු බවත්, ඒ සඳහා රු. 56,000.00 ක මුදලක් එම ආයතනය විසින් අය කරන බව දන්වමින් සභා කාර්යාලයේ ඉල්ලීම පරිදි

ගෝමඩුව, යටියන්තොට Sankasoft creations ආයතනයේ කළමනාකරු, එච්.ඒ. ජස්ටින් ප්‍රේමදාස මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ නිල වෙබ් අඩවිය සභා අරමුදලින් රු.56,000.00 ක මුදලක් වැය කර සංවර්ධනය කර යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව සභා අරමුදලින් රු. 56000.00 ක වැයකර ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ නිල වෙබ් අඩවිය සංවර්ධනය කර යාවත්කාලීනව පවත්වාගෙන යාමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(xi). 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් වෙන්දේසි කිරීම සඳහා අබලි ටයර් ඉදිරිපත් කලත්, කිසිවෙක් විසින් ඉල්ලුම් නොකිරීම නිසා වෙන්දේසි නොවුන බැවින් එම ටයර් සියල්ල රු. 2500.00 ක මුදලකට ලබා දෙන ලෙසට ඉඹුල්පේ අලුත්නුවර එන්.කේ. ටයර් සෙන්ටර් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් මේ සඳහා ඔබතුමන්ලා නියෝජනය කරනු ලබන කොට්ඨාශයන්හි වෙනත් ඉල්ලුම්කරුවන් සිටිනම් අද දින සිට සතියක කාලයක් ඇතුලත ඉල්ලුම් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

නාය යන ස්ථානවල භාවිතය සඳහා ප්‍රදේශයේ පුද්ගලයන් විසින් ඉල්ලුම් කරන බැවින් ඒ සඳහා අවස්ථාව ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් ප්‍රකාශ කරමින් රු. 3000 ක මුදලකට වෙනත් ඉල්ලුම්කරුවෙකුට ලබා දිම සුදුසු බවට යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව වෙන්දේසි නොවී ඉතිරිව පැවැති අබලි ටයර් රු. 3000.00 ක මුදලකට අලෙවි කිරිමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(xii). මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන වනාන්තර ගිනි තැබීම් වලදී ජීව ආරක්ෂක වැටක් ලෙසත් මව් වනය තුලට ගිනි පැතිරීයාම වැළැක්වීම සඳහා ගිනි ප්‍රතිරෝධී ශාක රෝපණය ලෙසත් හණ ශාක හණ පැළ 2000 ක් වගා කිරීමේ ක්‍රියාකාරකම් වලට අදාලව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද රු. 54,000.00 ක වියදමකින් යුතුව ඉදිරිපත් කරන ලද අපේක්ෂිත වියදම් ඇස්තමේන්තුව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

වනාන්තර ගිනි තැබීම් වලදී ජීව ආරක්ෂක වැටක් ලෙස හණ පැළ 2000 ක තවානක් රෝපණය කිරීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරමින් වන සංරක්ෂණය සඳහා උනන්දුවෙන් ක්‍රියා කිරිම පිළිබඳව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමාට ස්තුතිය පල කරන ලදි.

ඒ අනුව හණ පැළ 2000 ක් වගා කිරීමේ ක්‍රියාකාරකම් වලට අදාලව රු. 54,000.00 කින් යුතු අපේක්ෂිත වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.
(xiii). පිඩලිගන්නාවෙල මාර්ගයේ අබලන්ව ඇති කි.ග්‍රෑ. 650 ක් පමණ බරකින් යුතු කම්බි පාලම

රු. 40 000.00 ක මුදලකට මිලදී ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් බලංගොඩ මොරහැල, හදරිලියවත්ත පදිංචි රසිඩ් මොහොමඩ් රම්සාන් මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් එම කම්බි පාලම සහිත මාර්ගය භාවිතා කිරිමට නොහැකි බැවින් සබරගමුව පළාත් සභාවේ අනුග්‍රහය යටතේ එම ස්ථානයෙහි පැති බැම්මක් ඉදිකළා. අබලන්ව පවතින එම කම්බි පාලම ඉවත් කර දෙන ලෙසට ගම්වාසින් ඉල්ලිම් කලා. මෙහි පවතින කම්බි කිසිවෙකු විසින් ගලවාගෙන යාමට හැකි බැවින්, ඊට පෙර කාර්මික නිලධාරි මහතගේ අධික්ෂණය උපදෙස් හා නිර්දේශ මත මෙම ඉල්ලුම්කරුටත් වෙනත් ඉල්ලුම්කරුවන්ටත් ඉල්ලුම් කිරීමට හැකි ආකාරයට සීමිත මිළ ගණන් කැඳවීමකින් සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරාගෙන කම්බි පාලම ගලවා ඉවත් කිරිම සුදුසු බවට යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව කාර්මික නිලධාරි මහතගේ අධික්ෂණය, උපදෙස් හා නිර්දේශ මත මෙම ඉල්ලුම්කරුටත් වෙනත් ඉල්ලුම්කරුවන්ටත් ඉල්ලුම් කිරීමට හැකි ආකාරයට සීමිත මිළ ගණන් කැඳවීමකින් සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරාගෙන කම්බි පාලම ගලවා ඉවත් කිරිමටත්, ටෙන්ඩර් ඉල්ලුම්කරන ලෙස මෙම ඉල්ලුම්කරු වෙත දන්වා යැවීමටත් ලැබෙන ආදායම සභා අරමුදලට යොදා ගැනීමටත් තීරණය විය.

(xiv). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බෙලිහුල්ඔය, ගලගම සංචාරක ගිමන්හල ඉදිරිපිට මාර්ග සංවර්ධන අධිකාරියට අයත් භූමියේ අනවසරෙන් ඉදිකිරීම් කරන ලද වෙළඳ කුටි පෙළ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉවත් කිරීම හේතුවෙන් ජීවනෝපාය අහිමිවූවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය එල්ලාවල මැතිතුමාගේ විමධ්‍යගත අරමුදලින් රුපියල් ලක්ෂ තිහක වියදමකින් රෝද සවි කරන ලද ජංගම වෙළඳකුටි ඉදි කර දිමටත්, එමඟින් සභාවට ආදායම් උත්පාදනය කරවා ගැනීමටත් අදාලව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ජංගම වෙළඳකුටි ඉදිකරවා ප්‍රාදේශීය සභා පාලනය යටතේ ප්‍රදේශයේ ජනතාවට ස්වයංරැකියා අවස්ථා බිහිකර දී එමඟින් ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදනය කරවා ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු උප සභාපති එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය එල්ලාවල මැතිතුමාගේ විමධ්‍යගත අරමුදලින් රුපියල් ලක්ෂ තිහක වියදමකින් ජංගම වෙළඳකුටි ඉදිකරවා ප්‍රාදේශීය සභා පාලනය යටතේ ප්‍රදේශයේ ජනතාවට ස්වයංරැකියා අවස්ථා බිහිකර දී එමඟින් ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදනය කරවා ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.
(xv). ගරු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් සඳහා සිංහල අලුත් අවුරුදු උත්සවය නිමිත්තෙන් උත්සව අත්තිකාරම් මුදලක් ලබා දෙන ලෙසට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරමින් එම යෝතිබෙනවා.
උත්සව අත්තිකාරම් වශයෙන් රු. 50000.00 ක ණය මුදලක් ගෙවීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
සභා අරමුදල් ප්‍රමාණය සලකා බලා රු.25000.00 ක ණය මුදලක් ලබා දීමත් එම ණය මුදල මාසික වාරික 03 කින් කපා හැරීමත්, ඊට අදාල පොළිය අය කර ගැනිමත් කටයුතු කලයුතු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව රු.25000.00 ක මුදලක් ලබා දීමත් එම මුදල මාසික වාරික 03 කින් කපා හැරීමත්, ඊට අදාල පොළිය අය කර ගැනිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

(06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද පෙබරවාරි මස 01 වන දින සිට පෙබරවාරි මස 28 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 81 සහ වවුචර් අංක 72 සිට 167 දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ වවුචර් උපලේඛන 2022.03.02. වන දින පැවැති මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී .
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද පෙබරවාරි මස 01 වන දින සිට පෙබරවාරි මස 28 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 45 යටතේ රු. 142,000.00 ක මුදලක් ගෙවා තිබෙනවා. ඒ පිළිබඳව පැහැදිලි කරන්න.
එම ගෙවීම පිළිබඳව සාකච්ඡා කිරිම සඳහා ගරු සභාපතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් විය.
එම සාකච්ඡාවෙන් අනතුරුව, ගරු සභාපතිතුමාගේ සහ ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් විය.

ඒ අනුව රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේකය අනුව එක් නිලධාරියෙකුට එක් දිනකට රු. 1000.00 බැගින් ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සහභාගී වූ නිලධාරින්ට රු. 142,000.00 ක මුදලක් ගෙවන ලද බව ලේකම්තුමිය විසින් කාරක සභා අවස්ථාවේ දී ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මුදල් කමිටු අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

(06). (ii). ටෙන්ඩර් මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම.

2022.03.02. දින පැවැති ප්‍රසම්පාදන කමිටුව විසින්,

01.බල ප්‍රදේශයේ වීථි පහන් සවි කිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා වීථි පහන් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
02. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ හියුම් පයිප්ප අංගනයේ හියුම් පයිප්ප නිෂ්පාදනය සඳහා නිෂ්පාදන ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

03.ජල ව්‍යාපෘති සංවර්ධන කටයුතු සඳහා ජල මීටර් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
04අලුත්නුවර ජල යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය ජල උපාංග මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
05.කාර්යාලයේ ගබඩාවේ විධිමත්ව රාක්ක සැකසීම සඳහා මිල ගණන් කැඳවීම.
06. හියුම් පයිප්ප අංගනයේ නාම පුවරුවක් සැකසීම සඳහා මිල ගණන් කැඳවීම.

07. ප්‍රාදේශීය සභාවේ RV – 3020 හා RW – 4358 අංක දරන ට්‍රේලර් රෙපයාර් කිරීම සඳහා මිළ ගණන් කැඳවීම.
08. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා A4 ජයා පිටපත් කඩදාසි මිලදී ගැනීම.
09.සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපාංග සඳහා මිළ ගණන් කැඳවීම.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමට අදාල වූ ප්‍රසම්පාදන කමිටු වාර්තාව සහා අනුමැතිය ලබා ගැනිම සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාගේ විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(07). ආදායම් වියදම් වාර්තාව.
2022 පෙබරවාරි මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

(08). වෙනත් කරුණු.
(i). නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරිම,
01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී , ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා,
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමා,
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා,
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා,
05. ප්‍රාදේශීය සභා මන්ත්‍රී, අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා,

යන ගරු මන්ත්‍රීවරුන් අසනීප වී ඇති බැවින් අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව දුරකතනය මඟින් දැනුම් දී තිබෙනවා. ඔවුන්ගේ නිවාඩු අනුමත කිරීමට අදාලව ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද නිවාඩු ඉල්ලුම් කිරීමේ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් නිවාඩු අනුමත කිරිමට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
වලිගය කපා දමා ඇති ගවයෙකු අසනීපව අසාධ්‍ය තත්ත්වයෙන් අයාලේ මහ මග සැරිසරමින් සිටිය දී මහ මග වැටී සිටිනවා. ගම්වාසීන් එම ගවයා ආරක්ෂිතව රැක බලා ගන්නවා. ප්‍රවාහන පහසුකම් සපයන්නේනම් එම ගවයා ආරක්ෂිත ස්ථානයකට රැගෙන යා හැකියි. ඒ සඳහා පහසුකම් සලසන්න.

එමෙන්ම ගවයන් රැකබලා ගැනීමට ඇති අපහසුතාවය මත ඇල්ලේඅරාව ප්‍රදේශයේ අයාලේ මහ මග සැරිසරනවා. එහෙත් එම ගවයන් වෙනත් ඉල්ලුම්කරුවන්ට ගවයන් ලබා දීමට හිමිකාරිය කැමැත්ත පල කර සිටිනවා. එම නිසා ප්‍රදේශයේ ඉල්ලුම්කරුවන්ට එම ගවයන් ලබා දීමට අවශ්‍ය පියවර ගන්න.
විදුලි බල මණ්ඩලය විසින් බල ප්‍රදේශය තුල අධි බලැති විදුලි රැහැන් පද්ධතියක් සවි කිරිම සඳහා සංවර්ධනය කරන ලද සහ සංවර්ධනය කරමින් පවතින මාර්ගයන්හි විදුලි කණු රැගෙන යනු ලබනවා. මේ නිසා මාර්ගයට අලාභහානි සිදුවිය හැකි බැවින්, මාර්ගයට අලාභහානි නොවන පරිදි ඒවා කොටස් වශයෙන් රැගෙන යන ලෙස කොන්ත්‍රාත් ක්‍රියාත්මක කරනු ලබන එස්.ඩී.සී.සී. සමාගම වෙත කඩිනමින් දන්වා යවන්න.

(iii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
පසුගිය දිනවල දී සභා ජල යෝජනා ක්‍රමවලට අදාලව හිඟ ජල ගාස්තු අය කිරීමේ ජංගම සේවා වැඩසටහනක් සභාවේ නිලධාරින් විසින් සිදු කළා. එය වටිනා සේවයක්. එහෙත් ප්‍රදේශයේ ජනතාවට හිඟජල බිල්පත ගෙවීමට නිසි ක්‍රමවේදයක් නොමැතිකම නිසා මෙසේ හිඟ ජල ගාස්තු එකතු වනවා. මේ නිසා බැංකු විධිමත් පද්ධතියක් තුලින් හිඟ ජල ගාස්තු ගෙවීමට ක්‍රමයක් සකස් කරන්න.
පින්නවල නගර සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අදාල ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතිනවා. තවම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අවසරය ලබා දී නැහැ. සංවර්ධන කටයුතු සිදු කිරිමට නියමිත අමාත්‍යාංශය ප්‍රකාශ කලේ ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් වූ වහාම සංවර්ධන කටයුතු කඩිනමින් ආරම්භ කල හැකි බවයි එම නිසා කඩිනමින් ඉඩම් පවරා දිමට අදාල කටයුතු සිදු කරන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත දැනුවත් කරන්න.
ආර්ථික වශයෙන් ජීවන මට්ටම පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වෙලා. මේ නිසා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් ලෙස සමෘද්ධි කළමනාකරණ නිලධාරින්, ගොවිජන සේවා නිලධාරින් මහජනතාව සමඟ ඒකරාශී වී සුහදව සාකච්ඡා කර මෙම අර්බුධයෙන් මිදීමට වැඩ පිළිවෙලක් සකස් කරමු.

ගුරුබැවිල මාර්ගයේ කණතිරියන්වෙල හංදියේ මඟී බස්රථ ආවරණයක් ඉදිකිරිම සඳහා ප්‍රදේශයේ විශ්‍රාමලත් ගුරුවරියක් මූල්‍ය දායකත්වය සැපයීමට කැමැත්තෙන් සිටිනවා. එමඟින් මඟී බස්රථ අවාරණය ඉදි කිරිම සඳහා අවශ්‍ය සහයෝගය සභාව විසින් සකසා දෙන්න.

(iv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමින්,
ගුරුබැවිල මාර්ගයේ කණතිරියන්වෙල හංදියේ මඟී බස්රථ ආවරණයක් ඉදි කිරිම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් අවසර ලබා ගත්තා. එහෙත් ඒ අසල ඉඩම් හිමිකරු ඒ සඳහා ඉඩ ලබා නොදීම නිසා ඉදිකිරිම් කටයුතු සිදු කිරීමට හැකියාවක් නැහැ. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් භූමියේ මඟී බස් රථ ආවරණය ඉදි කිරිමට සහයෝගය ලබා දෙන්න.
ගුරුබැවිල මාර්ගය දෙපස වැවී ඇති බිම් මට්ටමේ තණකොළ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කපා දමනු ලබනවා. එහෙත් මාර්ගයට ඉහළින් මාර්ගය දෙපස මාර්ගයට මුහුණලා වැවී ඇති ගස්වල අතු කපා දමන්නේ නැහැ. ඒ හේතුව නිසා වාහන වල එම අතු වදිනවා. ඒවා ඉවත් කිරිමට කටයුතු කරන ලෙසට මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන්න.
කොරෝනා වසංගත තත්ත්වය පැතිර යාම පාලනය කිරිම සඳහා පින්නවල සති පොළ නොපැවැත්වීම නිසා එම ස්ථානයේ වල්බිහි වී පවතිනවා. එමෙන්ම පින්නවල සිට උඩගම පාසල දක්වා මාර්ගය ඉදි කිරීමේ දී සභාව විසින් පරීක්ෂා කිරීම් සිදු කර නැහැ. ඒ හේතුවෙන් මාර්ගය සංවර්ධනය කිරීමේ දී ඉතිරි වූ කාපට් දෙවන වරටත් මාර්ගයට යෙදීම නිසා ගැට්ට සහිත මාර්ගයකින් පොළ භූමියට පිවිසීමට සිදු වෙලා. ඒ පිළිබඳව සොයා බලන්න.
(v). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය අදහස් දක්වමින්,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ගල්ලෙනකන්ද ප්‍රධාන මාර්ගය කාපට් කර සංවර්ධනය කිරිමට නියමිත වුවත් එම ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු ප්‍රමාදයි. එම නිසා මාර්ගය භාවිතා කරනු ලබන

ප්‍රදේශයේ ජනතාව දැඩි අසීරුතාවයට පත්ව ඇති බැවින් එම මාර්ගය කඩිනමින් සංවර්ධනය කර දෙන ලෙසට අවශ්‍ය ආයතන දැනුවත් කරන්න.

(vi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
බලංගොඩ මූලික රෝහලේ මරණයකදී මිණිය සැරසිම් කටයුතු සිදුකර අයිතිකරුවන්ට එහි කොටස් මල්ලකට දමා ලබා දී රු. 2000.00 කුත්, මත්ද්‍රව්‍යත් ඉල්ලනවා. මරණයක දී මිනිසුන් අසරණ භවයට පත් වන බැවින් එවැනි අවස්ථාවන් වලදී මේ ආකාරයට මිනිසුන් තවත් අසරණ නොකළ යුතු බැවින් නීති විරෝධී අය කිරීම පිළිබඳව සොයා බලන්න.

රටතුල පවතින ආර්ථිකය නිසා ජනතාව පීඩිත වෙලා. ගෑස්,ඩීසල් පෝලිම් වල ඉන්න වෙලා. ඩීසල් තිබුණත් දෙනේනේ නැහැ. සභාපතිවරයා ලෙසත් ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් ලෙසත් ඔබතුමන්ලාට මේ පිළිබඳව විමසා බැලිය හැකියි. ජාතික දේශපාලනය පිළිබඳව කතා කරනවා නොවෙයි, පැටලෙන්න හදනවා නොවෙයි, එහෙත් ඔබතුමන්ලාට ජනාධිපතිතුමා සමඟ, අගමැතිතමා සමඟ, මුදල් අමාත්‍යතුමා සමඟ, ආණ්ඩුකාරවරු සමඟ, ආණ්ඩුව සමඟ සාකච්ඡා කරන්න හැකියාව තිබෙනවා. අදහස් ඉදිරිපත් කරන්න. උදේට ගෑස් පොලිමේ රාත්‍රියට ඩීසල් පෝලිමේ. සභාවට ඩීසල් ලබා ගැනීමේ දී ඔබතුමාටත් පඹහින්න ෂෙඩ් එක සමඟ ගැටලුවත් ඇති වුණ බව දැන ගන්නට ලැබුණා. පඹහින්න බලංගොඩ ෂෙඩ් වල ඩීසල් තිබෙනවා. එහෙත් ලබා නොදීම ගැටලුවක්. බලංගොඩ ජීවිත මහතාගේ ෂෙඩ් එකෙන් පමණයි සාධාරණ විදිහට ඩීසල් ලබා දෙන්නේ. ඔබතුමන්ලාත්, මමත් මන්ත්‍රීවරු ලෙස ඡන්දයක් අවස්ථාවකදී ගමට යා යුතුයි. පක්ෂය වුවත් විපක්ෂය වුවත් අපි ජනතාවගේ පැත්තේ. ජනතාව අසරණ වෙලා. අද අතිගරු ජනධිපතිතුමා ජාතිය අමතනවා. අඩුම තරමේ ජනතාවට සැමන් පරිප්පු අඩු මිලට ලබාදෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. ඔබතුමන්ලා ආණ්ඩුව දැනුවත් කරන්න. මේ පිළිබඳව අමාත්‍යවරයා දැනුවත් කරන්න. සමඟි ජනබලවේගය ලෙසත්, විපක්ෂය ලෙසත් රට තුල උද්ගතව පවතින ආර්ථික අර්බුධයට විරෝධය ප්‍රකාශ කරනවා.

(vii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ්.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කුඩා තේවතු හිමියන් පොහොර නොමැතිවීම, තේවතු වල වැඩ කරන අයගේ දෛනික කුළී ගාස්තුව අධික වීම නිසා, ප්‍රවාහන ගාස්තු වැඩිවීම නිසා අසරණ වෙලා. තේ වගාව පවත්වගෙන යා නොහැකි තත්ත්වයට පත් වෙලා. මේ තත්ත්වය වළක්වා ගැනීමට කටයුතු කල යුතුයි. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ අධ්‍යාපනය ලද දරුවන්ට රැකියා අවස්ථා නැහැ.මේ රටේ විකෘතිභාවය අටපට්ටම් වෙලා. පාලකයෝ විසින් හිතාමතා කරන දෙයක් ද? මුදල් හිඟතාවය නිසා සිදුවන්නක් ද? පැහැදිලි නැහැ. බුද්ධිමත් ජනතාව නිසි තැන ඉඳලා නැහැ.
විශාරද නන්දාමාලනී, ධර්මපාලතුමා, එස් මහින්ද හිමියන්, රට පිළිබඳව ජාත්‍යාලයෙන් කතා කලා. ශ්‍රී ලාංකීය ජාතික ගායනා කරන විට විදේශකයෝ අසා සිටියොත් අප විහිළුවකට පත් වෙයි. ලාංකීය ජාතික ගීය අද විහිළුවක් වෙලා. දේශපාලන ගැතිකම්වලින් තොරවකටයුතු සිදු විය යුතුයි.

(viii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
මාර්ගය දෙපස පිහිටි නිවාස වලින් අවිධිමත් පරිදි අපවිත්‍ර ජලය මාර්ගයට බැහැර කිරීම නිසා මාර්ගය අපවිත්‍ර වෙලා. මාර්ගය පවිත්‍රව තබා ගැනීම සඳහා ඉඩම තුල ම වලවල් සකසා අපවිත්‍ර ජලය බැහැර කිරිමට ක්‍රමවේදයක් සැකසීමත් ඒ බව ජනතාව දැනුවත් කිරිමටත් පියවර ගත යුතුයි. ඒ පිළිබඳව කඩිනමින් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට විධායක ඉංජිනේරු කාර්යාලය දැනුවත් කරන්න.
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ නිවාස කමිටුව විසින් අඩු ආදායම්ලාභී පවුල්වලට ද්‍රව්‍ය ආධාර ලබා දිමට තීරණය කිරීමත් සමඟ ඊට අදාල ක්‍රමවේදය සකස් කරමින් පවතිනවා. ඒ සඳහා අදාල ආකෘති පත්‍රය පුරවා කඩිනමින් කාර්යාලයට ලබා දීමට ගරු මන්ත්‍රීවරුන් කටයුතු කරන්න.

කාර්යාල නිලධාරින් විසින් පින්නවල ප්‍රදේශයේ ආදායම් රැස් කිරිමේ කටයුතු සඳහා සහභාගී වී තිබුණා. ඒ සම්බන්ධ තොරතුරු වාර්තා කරන්න.

(ix). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය අදහස් දක්වමින්,
සේවක අර්ථ සාධක අරමුදලට හිමිකම් ලැබූ වතු කම්කරුවන් සඳහා පමණක් රජය විසින් සහන මිලට තිරිඟු පිටි ලබා දිමට පියවර ගෙන තිබෙනවා. වතු සමාගමෙන් මේ පිළිබඳව ඉල්ලීමක් කලත් පලක් නැහැ. එහෙත් කෙකාසි වලට, දෛනික වැටුපට වැඩ කරන කම්කරුවන්ට මෙම සහනාධාරය හිමි නොවීම අසාධාරණ බැවින් සියලුම වතු කම්කරුවන්ට මෙම සහනාධාරය ලබා දීමට අවශ්‍ය පියවර ගන්න.
මේ අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා නැගී සිටිමින් අදහස් දක්වමින්,
රයි වතුයායේ දෛනික වැඩකරන වතු පවුල් හතළිහක් පමණ සිටිනවා. ඔවුන්ට අසාධාරණයක් සිදුවන බව දක්නට ලැබෙනවා. එම නිසා වතු කම්කරුවන් සියලුම දෙනාට යම් සහනයක් ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
අසනීප තත්ත්වයෙන් පසුවන ගවයා ප්‍රවාහනය කිරීමට පෙර ග්‍රාමනිලධාරිතුමා පශු වෛද්‍යතුමා දැනුවත් කල යුතුයි. අනතුරුව ආරක්ෂිතව රැක බල ගන්නා ස්ථානයට ප්‍රවාහනය කරන්න.

හිමිකරු දැනුවත්ව ගවයන් මහමඟ සැරිසැරීමට ඉඩ සැලසීම නීත්‍යානුකූලව වරදක්. හම් සලකුණු, කන් සලකුණු පැරණි ක්‍රමවේදයන් වන අතර අයාලේ සැරිසරණ ගවයන්ගේ නිත්‍යානුකූල අයිතිකරු හඳුනා ගැනීමෙන් අනතුරුව නීත්‍යානුකූල ආකාරයට ඉල්ලුම්කරුවන්ට බෙදා දීම සිදු කලයුතුයි.
ප්‍රාදේශීය සභා මාර්ගයන් භාවිතා කිරීමේ දී ටොන් 05 කට වඩා බර රැගෙන යා නොහැකි අවස්ථාවන්වලදී ඒ බව ප්‍රාදේශීය සභාව දැනුවත් කිරිමට පියවර ගත යුතුයි. එවැනි අවස්ථාවන් වලදී කාර්මික නිලධාරි මහතා හෝ සුදුසු නිලධාරියෙක් නම් කර ඒ පිළිබඳව අධික්ෂණය කිරීමට පියවර ගන්නවා. මාර්ගය අබලන් වුවවොත් ගම්වාසීන්ට ගැටලුවක්. සංවර්ධන කටයුතු නතර කිරීම රටට පාඩුවක්. කරදියමුල්ල ප්‍රදේශයේ මෙවැනි ගැටලුවකදී ලක්ෂ තුනක මුදලක් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරවා ගැනීමෙන් අනතුරුව එම කාර්යය සිදු කරවා ගැනීමට පියවර ගත්තා.
එමෙන්ම ප්‍රාදේශීය සභා මාර්ගවල විදුලි කණු සිටුවීම පිළිබඳව සභාව දැනුවත් කිරිමට පියවර ගන්නා ලෙස සැම් ඩැම් ආයතනය දැනුවත් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වීම අනුව,
බැංකු පද්ධතියකින්, තැපැල් කාර්යාලයකින් මුදල් ඇණවුමක් මඟින් ස්මාර්ට් ජංගම දුරකතනයකින් හෝ වෙනත් ක්‍රමයකින් සභාවට අයවිය ගාස්තු ගෙවීමට හැකිවන පරිදි ක්‍රමවේදයක් සකස් කිරීමට සාකච්ඡා කරමින් පවතිනවා. මෙම යෝජනාව ඉතා කඩිනමින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර එමඟින් පහසුවෙන් හිඟ මුදල් ගෙවීමට හැකියාව උදාවෙනවා.

පින්නවල නගර සැලැස්මට අදාල ඉඩම් පරීක්ෂා කිරීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අද දින පැමිණීමට නියමිතයි. ගරු නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන අග්‍රාමාත්‍යතුමාගේ සංකල්පයක් වන සියක් නගර වැඩසටහනට පින්නවල නගර සැලැස්ම ඇතුලත් වී තිබෙන බව සතුටින් දන්වා සිටිනවා. එම වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක වෙමින් පවතින බැවින් පින්නවල නගර සැලැස්මත් කඩිනමින් ක්‍රියාත්මක වෙතැයි බලාපොරොත්තු වෙනවා. එමෙන්ම මින් පසුව සභාව පැවැත්වෙන අවස්ථාවල් වලදී පින්නවල නගර සැලැස්ම පිළිබඳව විනාඩි පහක කාලයක් න්‍යාය පත්‍රය තුලින්ම සාකච්ඡාවට බඳුන් කිරීමට ඉඩ සකසන ලෙස ලේකම්තුමියට උපදෙස් ලබාදෙනවා.

කඩිනමින් ක්‍රියාත්මක කිරීමට නියමිත යෝජනා පිළිබඳව පින්නවල නගර සැලැස්ම සඳහා පත්කරන ලද කමිටුව රැස්වී සාකච්ඡා කරන්න. ඒ සඳහා සභාවේ පූර්ණ සහයෝගය ලබා දෙනවා.
ජනතාවගේ ආදායම් වැඩි කිරීමට ආර්ථික තත්ත්වය නගා සිටුවීමට ඔබතුමා යෝජනා ඉදිරිපත් කරන්න. සභා කාර්යාලයේ නිලධාරින් පත්කර ඒවා ක්‍රියාත්මක කිරීම අවශ්‍ය සහයෝගය සභාව විසින් ලබා දෙනවා.
මඟී බස්රථ ආවරණය සකස් කිරීම පිළිබඳව පොලිස් රථ වාහන කමිටුවට ඉදිරිපත් කරනවා. එහෙත් එම පොලිස් රථ වාහන කමිටුව රැස් නොවීම නිසා ඉදිරිපත් කරන ලද යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කරවා ගැනීමට සාකච්ඡා කිරීමට නොහැකි වී තිබෙනවා. එම නිසා පොලිස් රථ වාහන කමිටුව කඩිනමින් රැස්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත දන්වා යැවීමටත්, සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා එම කමිටුවට ඉදිරිපත් කිරීමටත් කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වීම අනුව,
ගුරුබැවිල මාර්ගයේ මඟී බස් රථ ආවරණය ඉදි කිරීමට අවශ්‍ය පියවර කඩිනමින් ගන්නා ලෙස පොලිස් රථ වාහන කමිටුවට දන්වා යවනවා.
මාර්ගය දෙපස එළි පෙහෙලි කිරීමේ කාර්යය සඳහා රු. 6000.00 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගමේ අයට ලබා දී තිබෙන බව දැනගන්නට තිබෙනවා. මාර්ගය දෙපස බිම් මට්ටමේ ඇති තණකොළ පමණක් නොව මාර්ගයට නැවී ඇති ඉහළ අතු ද කපා ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන්න.
එක් වරක් ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් පින්නවල පොළ පැවැත්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුවත් කළා. නැවත වරක් දැනුවත් කිරීමට කටයුතු කරනවා.
සභාවට යෝජනා ඉදිරිපත් කිරීමේ දී සියලු යෝජනා ලිඛිතව ලබා දෙන්න. සභා රැස්වීමේ දී හඬ පටය භාවිතා කලත් එහි තාක්ෂණික දෝෂ ඇති විය හැකියි. එමෙන්ම එහා කෙළවරේ සිට ඉදිරිපත් කරන යෝජනා මෙහා කෙළවරට නොඇසෙනවා විය හැකියි එම නිසා රැස්වීම් වාර්තාව සකස් කිරීමේ පහසුව සඳහාත්, මෙම යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී විෂය නිලධාරින්ට ඒ පිළිබඳව දැනුවත් කිරීමේ පහසුව සඳහාත් එම යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කරවා ගැනීමටත් සියලුම යෝජනා ලිඛිතව ලබා දීමට පියවර ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය අදහස් දක්වීම අනුව,
ගල්ලෙනකන්ද මාර්ගයේ සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කිරීමට පියවර ගන්නා ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවීමට පියවර ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
මරණයක් සිදු වන්නේ ක්ෂණිකවයි. එවැනි අවස්ථාවල්වලදී තවත් පීඩනයට පත් නොකල යුතුයි. ඒ සඳහා විරෝධය දක්වන අතර බලංගොඩ මූලික රෝහලේ මෘත ශරීරාගාරය තුල සිදුවන අකටයුතුකම් වැළැක්වීම සඳහා ඒ පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවට මෙම යෝජනාව ඉදිරිපත් කරනවා.
ෂෙඩ් වල ඩීසල් තිබිය දී ලබා නොදීම වරදක් ඕනෑම ෂෙඩ් එකකට රාජ්‍ය කටයුතු සඳහා ඉන්ධන සංචිතයක් පවත්වාගෙන යා හැකියි. වැඩි මිලට අලෙවි කිරීමට හැකියාවක් නැහැ. එසේ කිරීමේ දී රජය මෙන්ම මහජනතාවත් අපහසුතාවයට පත් වෙනවා. මෙම යෝජනාව ලිඛිතව ලබා දෙන්නේනම් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, විෂය භාර අමාත්‍යතුමා දැනුවත් කිරීමට පියවර ගන්නවා.
ජනතාවට දැනෙන ප්‍රශ්න පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීමෙන් පැටලෙන්න හදනවා යැයි මා සිතන්නේ නැහැ. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව යෝජනා සහ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබෙන අතර ජනතාවට සේවය කිරීම මහජන නියෝජිතවරුන්ගේ වගකීමක්. සභාව තුලදි යුක්‍රේන රුසියා අර්බුදය වැනි අදහස් පිළිබඳව කතා කළාට පලක් නැහැ. බල ප්‍රදේශයේ ජනතාවට දැනෙන ප්‍රශ්න කතා කලාට ප්‍රශ්නයක් නැහැ. ජනතාවට දැනෙන ඕනෑම සාධාරණ විවේචන ඉදිරිපත් කල හැකියි. එය මහජන

නියෝජිතවරුන්ගේ වගකීම. වසර ගණනාවක සිට පැවත ආ ක්‍රමවේදයේ දුර්වලතා හේතුවෙන්, පැතිර ගිය වසංගත තත්ත්වය හේතුවෙන්, රට වසා දමා තිබීම නිසා, ඩොලර් සංචිත හිඟවීම නිසා, විදේශ විනිමය රටට අහිමි වීම, අපනයන අඩු වීම, වසංගත තත්ත්වය පාලනයකිරීම සඳහා කඩිනමින් එන්නත්කරණය සිදු කිරීම, සංචාරකයන් නොපැමිණීම යන හේතූන් නිසා වර්තමාන පාලකයන්ට මෙම තත්ත්වය පාලනය කිරීමට හැකියාවක් ලැබුණේ නැහැ. එහෙත් තව මාස 06 ක්, වසරක් පමණ ගතවන විට රට යළි යථා තත්ත්වයට පත්වේයැයි බලාපොරොත්තු වෙනවා. රටේ ජනතාව ආර්ථික වශයෙන් අසරණ තත්ත්වයට පත්ව ඇති බව ඉහළ දේශපාලන අධිකාරිය වෙත ප්‍රශ්න සහ අවශ්‍ය දැනුවත් කිරීම් කරනවා.

සභා රැස්වීමට නොපැමිණෙන අවස්ථාවන් වලදී ඒ බව සභාපතිවරයාට, ලේකම්තුමියට, සභා කාර්යාලයට දුරකතනය මඟින් දැනුවත් කරන්න. එසේ නොකිරීමෙන් දීමනා ගෙවීමේ දී නීතිමය ගැටලුවලට මුහුණ දීමට සිදුවෙනවා. නිවාඩුව අනුමත නොවීමෙන් පෞද්ගලික ගැටලුවක් යැයි චෝදනා එල්ල කරනවා. නිත්‍යානුකූලව කටයුතු කර නීතිමය ගැටලු ඇති නොවන පරිදි දීමනාව ලබා ගැනීමට කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආ්.එච්.එම්. ගුනසේන මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
තේ වගාකරුවන්ගේ තේවගාව සඳහා අවශ්‍ය පොහොර සහනාධාරය ජනතාවට දැරිය හැකි මිලකට ලබා දීමට පියවර ගන්නා ලෙසට විෂය භාර අමාත්‍යවරයා වෙත දැනුවත් කිරීමට පියවර ගත්තා.
රට මුහුණ පා ඇති තත්ත්වයට රටේ සිටින සියලු දෙනා වගකිව යුතුයි. එම නිසා අප සැම දෙනාට හිමි වගකීම අප සැම විසින් භාර ගනිමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
නිවාස කමිටුව විසින් අඩු ආදායම්ලාභීන්ට අමු ද්‍රව්‍ය ලබා දීමේ දී ඊට අදාල නීත්‍යානුකූල කටයුතු නියමිත ආකාරයට සිදු කරන්න. සභාව විසින් අවශ්‍ය සහයෝගය ලබා දෙනවා.
අවිධිමත් ලෙස අපවිත්‍ර ජලය බැහැර මාර්ගයට බැහැර කරලීම පිළිබඳව විධායක ඉංජිනේරු කාර්යාලයත්, ඉඹුල්පේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයත් දැනුවත් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය අදහස් දක්වීම අනුව,
රජය විසින් තිරිඟු අර්ථ සාධක අරමුදල් හිමි වතු කම්කරුවන්ට පිළිගත් නිර්ණායකයක් මත පදනම්ව සහනාධාර ක්‍රමය යටතේ පිටි ලබා දීමට පියවර ගෙන ඇතැයි සිතනවා. වෘත්තීය සංගම් නියෝජනය කරනු ලබන නායිකාවක් ලෙස ඔබතුමිය මේ පිළිබඳව වෘත්තීය මංගම් මඟින් ඉල්ලීමක් කරන්න. සභාව විසින් විෂය භාර අමාත්‍යවරයා දැනුවත් කර සියලුම වතු කම්කරුවන්ට සහන සලසා දෙන ලෙස දන්වා යැවීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා නැවතත් නැගී සිටිමින් අදහස් දක්වමින්,
මා සභාවට නොපැමිණි දිනයට අදාලව වෛද්‍ය වාර්තාවක් රැගෙන පැමිණියා. එම වාර්තාව ඉදිරිපත් කල පසුව ගැටලුව විසදෙනවාද? මා හට හිමි දීමනාව ලබා ගත හැකිද?

ගරු සභාපතිතුමා අදහස් දක්මින්,
මෙතුමාගේ එදින නිවාඩුව අනුමත නොකළ බැවින් වෛද්‍ය වාර්තා ඉදිරිපත් කලාට පලක් නැහැ. එහෙත් සභාපතිවරයා ලෙස මා විසින් එම නිවාඩුව අනුමත නොකල බව ප්‍රකාශ කර තිබුණා. එහෙත් ලේකම්තුමිය ඇතුළු නිලධාරින් සිටියදී සභාපතිවරයාට එසේ කල නොහැකියි. එමෙන්ම හඩ පටිගත කිරීමේ යන්ත්‍රයක් භාවිතා කරන විට එසේ වංචාවක් කල නොහැකියි. එතුමාගේ නිවාඩුව කිසිවෙක් විසින් යෝජනා කර අනුමත කර තිබුණේ නැහැ. සභා වාර්තාව ලැබුණු පසුව තම නිවාඩුව අනුමත වී නොමැතිනම් ඊළඟ සභාවාරයේ දී සංශෝධන ඉදිරිපත් කර නිවාඩුව අනුමත කරවා ගන්න තිබුණා. එක් අවස්ථාවක දී ගරු උප

සභාපතිතුමාගේ නිවාඩුව ඉදිරිපත් කළත් සභා වාර්තාවේ සටහන් නොවීම නිසා එතුමා සංශෝධනයක් ඉදිරිපත් කර නිවාඩුව අනුමත කරවා ගැනීමට කටයුතු කලා. සභාපතිවරයා ලෙස මා පෞද්ගිලක හිතවත්කම්, අමනාපකම් සහා කටයුතු සඳහා භාවිතා කරන්නේ නහැ.

එහෙත් මෙම අවස්ථාවේ දී සුරංග මැතිතුමා වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන නිසා එතුමාට හිමි දීමනාව ගෙවිම සුදුසුයි. මේ සම්බන්ධයෙන් සභාවේ මන්ත්‍රීවරයෙකුගේ මන්ත්‍රීවරියකගේ විරෝධතාවයක් පවතින්නේදැයි ගරු සභාපතිතුමා විසින් විමසා අතර විරෝධතා ඉදිරිපත් නොවුණු බැවින් මෙම ගෙවිම සම්බන්ධයෙන් ලේකම්තුමියට නීතිමය ප්‍රශ්න ඇති නොවන අයුරින් ඒ බව පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් විමසා බලා නිවාඩුව අනුමත කර එතුමාට හිමි දීමනාව ගෙවීම සුදුසු බවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමාට සභාවට නොපැමිණීම නිසා ලබා නොගත් දීමනාව ගෙවීමේ එම යෝජනාව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙහි අධිභාර ක්‍රියාවලියක් සිදු වන්නේනම් එහි වගකීම ලේකම්තුමියට තනිව නොපැවරෙන අතර සභාවේ සභාපති, ගරු උපසභාපති, ඇතුළු මන්ත්‍රීවරු විසිපස් දෙනාටම වගකීම පවරෙන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (09). මී ළඟ සභා වාරයට දින නියම කිරීම.

සිංහල අලුත් අවුරුදු සමය ආසන්නයේ ඊළඟ සභාවාරය පැවැත්වෙන නිසාත් කාර්ය සාධන තරභාවලියට අනුව සෑම සභා වාරයක්ම සෑම මසකම දෙවන සතියේ දිනෙක පැවැත්වා තිබිය යුතු නිසාත් එම දිනය තීරණය කිරිම සඳහා ගරු සභාපතිතුමාගේ සහ ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

එම සාක්ච්ඡාවෙන් අනතුරුව, ගරු සභාපතිතුමාගේ සහ ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් විය.

ඒ අනුව ඊළඟ සභා වාරය අප්‍රේල් මස 08 වන සිකුරාදා දින පැවැත්වීමට දින නියම කරන ලදි.

## (10). ස්තූති කතාව හා අවසානය.

හත්වන සභාවේ හතළිස් නමවන සභාව සඳහා පැමිණි ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත් මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි.

ඉන් අනතුරුව, පෙ.ව. 11.55 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.